00100

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018/2019

**ESD2231/EPD4531-** ඉගෙනුම්-ඉගැන්වීම් පර්යාලෝකය

කාලය - පැය තුන (03) යි.

---

දිනය - **2020.09.27** වන දින                    වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.

<u>1 වන කොටස</u>

01. ඉගෙනුම හා ඉගැන්වීම අතර ඇති සබඳතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. දරුවකුගේ ඉගෙනුම් ක්‍රියාවලියට බලපාන සාධක තුනක් (03) පැහැදිලි කරන්න.

03. පෙර පාසල් දරුවන් සඳහා වන ඉගෙනුම් ක්‍රම පිළිබඳව මොන්ටිසෝරිගේ දාර්ශනික අදහස් විස්තර කරන්න.

04. 'සම්භවන තක්සේරුව' හා 'සම්පිණ්ඩිත තක්සේරුව' යන යෙදුම්වල වෙනස දක්වන්න.

05. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අවධි පැහැදිලි කරන්න.

06. "ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම" යන යෙදුම නිර්වචනය කරන්න.

07. කුඩා දරුවන්ගේ නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

08. 'අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා' හා 'අභිමත ඉගෙනුම් නිපුණතා' අතර ඇති වෙනස දක්වන්න

(ලකුණු 5   8 = 40)

## 2 වන කොටස

09. (I) 'ඉගෙනුම් -ඉගැන්වීම් ආධාරක' යන යෙදුම සුදුසු නිර්වචන යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(II) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දි ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක භාවිත කිරීමේදී ගුරුවරියක සලකා බැලිය යුතු සාධක පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) ඔබගේ පන්තිකාමරය තුල තාක්ෂණික ඉගෙනුම් ආධාරක යොදා ගැනීමේ දී ඇති විය හැකි ගැටලු පැහැදිලි කරන්න. ඊට සුදුසු විසඳුම් උදාහරණ සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10. (I) සුදුසු නිර්වචන සහිතව 'ප්‍රීතිමත් ඉගෙනුම' යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(II) ඉගෙනුම සඳහා දරුවන්ගේ අභ්‍යන්තර පෙළඹීම වැඩි කිරීම සඳහා බලපාන සාධක මොනවා ද? (ලකුණු 06)

(III) පෙර පාසල් හා ප්‍රාථමික පන්ති කාමරයක ප්‍රීතිමත් ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා ගුරුවරයාට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් (04) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (I) 'ඇගයීම' හා 'තක්සේරුව' යන යෙදුම්වල වෙනස දක්වන්න. (ලකුණු 04)

(II) තක්සේරුකරණ ක්‍රමයක් වශයෙන් 'නිරීක්ෂණය' යොදා ගැනීමේ දී ගුරුවරයා සලකා බැලියයුතු කරුණු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) ඇගයීමට වඩා තක්සේරුකරණයෙහි ඇති වාසි හතරක් (04) උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (I) ප්‍රාථමික පන්ති සඳහා යොදාගත හැකි ඉගැන්වීම් ක්‍රම හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(II) ප්‍රාථමික පාසල් දරුවන්ට සෘජු ඉගෙනුම් අත්දැකීම් ලබාදීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) වඩාත් ඵලදායී සෘජු ඉගැන්වීම් ක්‍රම යොදාගෙන ප්‍රාථමික මට්ටමේ දරුවන්ට සෘජු ඉගෙනුම් අත්දැකීම් ලබාදිය හැක්කේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (I) ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සම්බන්ධව රූසෝ විසින් ඉදිරිපත් කරන ලද දාර්ශනික මතය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(II) පෙර පාසල් හා ප්‍රාථමික පංතිවල දරුවන් සඳහා නිර්මාණාත්මක ඉගෙනුම් පරිසරයක් ස්ථාපිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(III) ඔබගේ පන්ති කාමරය තුළ නිර්මාණාත්මක ඉගෙනුම් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා ඔබ කටයුතු කරන්නේ කෙසේදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.